# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 2171635 — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1521/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 28/09/2024 පැය 0820

## මාධ්‍ය නිවේදනය

**01. මනුෂ්‍ය ඝාතනයක් - පිහිඹියගොල්ලෑව පොලිස් වසම.**

2024.09.25 වන දින හා 2024.09.27 වන දින අතර කාලසීමාව තුලදී පිහිඹියගොල්ලෑව පොලිස් වසමේ පීනගම ප්‍රදේශයේ පුද්ගලයෙකු අතුරුදහන් වීමක් සම්බන්ධයෙන් පිහිඹියගොල්ලෑව පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කරන ලදී. ඒ අනුව අතුරුදහන් වූ පුද්ගලයාගේ මෘත දේහය නිවසට ආසන්න පාවිච්චි නොකළ වැසිකිලි වළක දමා තිබියදී සොයාගෙන ඇත.

**මරණකරු වයස අවුරුදු 54 ක් වූ පීනගම, කැදැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරුගේ බිරිඳ සමඟ අනියම් සම්බන්ධතාවයක් පවත්වාගෙන ගොස් ඇති පුද්ගලයෙකු විසින් උදැල්ලකින් හා තියුණු ආයුධයකින් පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට දැනට සිදුකළ විමර්ශණයේදී අනාවරණය වී ඇත. මන්නා පිහියක් සහ උදැල්ලක් මෘත ශරීරය තිබූ ස්ථානයේ තිබී සොයා ගෙන ඇත. මෘත ශරීරය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදු කර අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ඝාතනය සම්බන්ධයෙන් වයස අවුරුදු 45 ක් වන කැදැව ප්‍රදේශයේ පදිංචි සැකකරු අත්අඩංගුවට ගෙන ඇත. පිහිඹියගොල්ලෑව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. තීරුබදු රහිතව මෙරටට ගෙන්වන ලද දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ කටුනායක ගුවන් තොටුපල ඒකකය.**

2024.09.28 වන අද දින අළුයම් කාලයේදී කටුනායක ගුවන් තොටුපල පරිශ්‍රයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ කටුනායක ගුවන් තොටුපල ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **තීරුබදු රහිතව අබුඩාබි සිට ගුවන් මගින් මෙරටට රැගෙන එන ලද විදේශීය දුම්වැටි 11200 (කාටුන් 56) සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන මිල්ලෑව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ කටුනායක ගුවන් තොටුපල ඒකකය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. නීති විරෝධී මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා සමග සැකකරුවෙකු අත්අඩංගුවට - රත්නපුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.09.27 වන දින දහවල් කාලයේ රත්නපුර පොලිස් වසමේ පැල්වාඩිය ප්‍රදේශයේදී රත්නපුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 1758 ක් (බැරල් 10 ක්), නීති විරෝධී මත්පැන් ලීටර් 22.5 ක් සමඟ සැකකරුවෙකු මත්පැන් පෙරීමට යොදා ගන්නා උපකරණද සමඟින් අත්අඩංගුවට** ගෙන රත්නපුර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන පැල්වාඩිය, රත්නපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

රත්නපුර පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. මාරක රිය අනතුරක් - පුවරසන්කුලම් පොලිස් වසම.**

2024.09.27 වන දින සවස් කාලයේ පුවරසන්කුලම් පොලිස් වසමේ වව්නියාව මන්නාරම මාර්ගයේ කුරුකල්පුදුකුලම් ප්‍රදේශයේදී වව්නියාව දෙස සිට මන්නාරම දෙසට ධාවනය වූ යතුරු පැදියක් පැදිකරුට පාලනය කර ගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන විදුලි රැහැන් කණුවක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදිකරු එම ස්ථානයේදීම මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 30 ක් වූ කුරුක්කල්පුදුකුලම්, පුවරසන්කුලම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය වව්නියාව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පුවරසන්කුලම් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**